# "අපි වවමු - රට නගමු" තවදුරටත් සක්‍රිය කිරීම අපේ සාර්ථකත්වයට මිම්මක් ....

"අපි වවමු - රට නගමු" ව්‍යාපෘති අධ්‍යක්ෂ
ඩී.එම්.ආර්.බී. දිසානායක


*"අපි වවමු - රට නගමු" දේශීය ආහාර නිෂ්පාදන දිරිගැන්වීමේ ජාතික මෙහෙයුමේ ව්‍යාපෘති අධ්‍යක්ෂ ඩී.එම්.ආර්.බී. දිසානායක මහතා හා සිදු කළ සංවාදයක් ඇසුරෙනි*

**කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සංවිධානය කෙරෙන ජාතික ගොවි සතිය සහ කෘෂිකර්ම ප්‍රදර්ශනය මෙවර පවත්වනු ලබන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බටඅත කෘෂි තාක්ෂණික උද්‍යානය කේන්ද්‍ර කරගනිමින්. අදාළ ජාතික උළෙල සඳහා මෙම ස්ථානය ම තෝරා ගැනීමේ විශේෂ හේතුවක් තිබුණා ද?**

කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් තාක්ෂණික ගොවිපළක මෙවර උළෙල පැවැත්විය යුතු යි, මෙන් ම දකුණු පළාතේ ස්ථානයක මෙය පැවැත්විය යුතු යි යන්න ආරම්භයේ පටන් පැවැති අදහසක්. ගියවර මෙම උළෙල පැවැත්වුණේ උතුරු පළාතේ. බටඅත කෘෂි තාක්ෂණික උද්‍යානය සැලසුම් කොට, නිර්මාණය හා සංවර්ධනය කළ ස්ථානයක් බැවින් මෙම ස්ථානය තෝරා ගැනීමට තීරණය වුණා.

**මෙවර උලෙළේ ප්‍රධාන තේමාව වී ඇත්තේ "තරුණ ගොවි දිවියයි - ඉසුරුබර හෙට දවසයි" යන්නයි. එවැනි තේමාවක් තෝරා ගැනීම සඳහා හේතු වූ කාරණා කවරේ ද?**

මේ රටේ මහින්ද චින්තන කෘෂිකර්ම වැඩපිළිවෙළ අනුව "අපි වවමු - රට නගමු" වැඩසටහන තමයි අවුරුදු තුනක් පුරාම දියත් කළේ. වී, අතිරේක භෝග, එළවළු, පලතුරු නිෂ්පාදනයන් හි ප්‍රමාණාත්මක වර්ධනය තුළින් ආනයන ආදේශන ඇති කොට විදේශීය ආනයන දොරටු වසා විනිමය මෙරට රඳවා ගැනීමයි බලාපොරොත්තු වුනේ. ඒ අනුව අපට අවශ්‍ය මූලික කරුණ ඉටුවුණා. අපි දිනුවා. ඉන් එහාට මෙම වැඩපිළිවෙළ ඉදිරියට ගෙනියන්න නම් තරුණයන් ප්‍රධාන ඉලක්ක කණ්ඩායම කරගනිමින් ඔවුන්ගේ ආකර්ෂණය දිනා ගැනීම වැදගත් වුණා. සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තයෙන් මිදී නවීන වගා



ජායාරූප : රංජිත් දිසානායක

ක්‍රම, නවීන යන්ත්‍ර, නවීන භෝග, දේශීය විදේශීය අපේක්ෂිත භෝග, අගය එකතු කිරීම් හා වැඩි කිරීම්, දේශීය ආහාර පරිභෝජනය ද දිරිගන්වා, රට ගැළපෙන භෝග ආහාර රටා හඳුන්වා දීම මෙහි දී වැදගත්. ඒ නිසා අපි කැමතියි තරුණයන් ඊට දායක කරගන්න. දිගු කලිසම් ඇඳි තරුණ ගොවීන් කුඹුරේ සිටිනවා දකින්න අපි කැමතී. අද අපේ රටේ ගොවීන් ප්‍රවාහනයේ යෙදෙන්නේ මෝටර් සයිකලයෙන්. වෙනත් විදේශීය රටවල නම් කාර්වලින්, ජීප්වලින්. මේ තත්ත්වය මෙවර ගොවි සතිය ප්‍රදර්ශන භූමියේ දී අපි පෙන්වා දෙනවා.

**එම ප්‍රදර්ශන අංග මොනවාද?**

අපි වවමු - රට නගමු වැඩසටහන යටතේ භෝග වර්ග 23ක් පමණ අපි හඳුන්වා දුන්නා. එම භෝග වර්ගවලට භෝග නායකයන් පත් කොට සිටිනවා. එම ආදර්ශන මෙවර ප්‍රදර්ශනයේ දී දැක ගන්න පුළුවන්. ඒ සාම්ප්‍රදායික ආකාරයට නෙමේ, බද්ධ කළ, එළදාව

කඩිනමින් ලැබෙන කුඩා මුදලකින් ආයෝජනය කළ හැකි ආකාරයට, උදාහරණයක් විදියට ගොරකා ගසට විශාල භූමි ප්‍රමාණයක් අවශ්‍ය වුණත් අපි මෙවර හඳුන්වා දෙන්නේ කුඩා ශාකයක් ලෙස. එය පවුලේ පාරිභෝජනයට ප්‍රමාණවත් අස්වැන්නක් ලබාදෙනවා. ඒ වගේ ම විසිතුරු ශාකයක් ලෙස ද දැකගත හැකි යි.

**කොයි ආකාර ආකර්ෂණයන් සිදු කළත් වර්තමාන තරුණ ගොවීන්ට තියෙන ප්‍රධාන ම ප්‍රශ්නය මූල්‍ය තත්ත්වය, දුර්වල වීම නිසා ණය ප්‍රතිපාදන ලබා ගැනීමේ ගැටළුව. ඒ සඳහා විසඳුම් ඉදිරිපත් කිරීම අවධානයට ගෙන නැද්ද ද?**

දැනට කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ණය ප්‍රාග්ධනය සපයන සෘජු ආයතනයක් නෑ, නමුත් මහ බැංකුව වැනි ස්ථානවල සපිරි ණය යෝජනා ක්‍රමය වැනි අවස්ථා තිබෙනවා. නමුත් තරුණ ගොවීන්ගේ අවශ්‍යතා හා ණය යෝජනා ක්‍රම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ දී පරතරයක් තිබෙන බව මං පිළිගන්නවා. අනෙක මේ පිළිබඳ එම ගොවීන් ද නිසි දැනුවත් වීමක් නෑ. මෙවැනි ණය යෝජනා ක්‍රම සහිත මූල්‍යායතන යම් යම් පරිපාලන පහසුකම් නිසා පුංචි පුංචි ණය ලබාදීමට වඩා වැඩි පොළියකට සීමිත පිරිසකට විශාල ණය සැපයීමට කැමතියි.

**හඳුනාගත් එවැනි ගැටළු සහගත අවස්ථාවන්වල දී මැදිහත් වීමට අමාත්‍යාංශයට හෝ නිලධාරීන්ට හැකියාවක් තිබේ ද?**

තරුණ ගොවි පිරිස් කණ්ඩායම් විදිහට සංවිධානගත වෙනවා නම් අපට මැදිහත් වීමට හැකි යි. බැංකුවල ණය හා ප්‍රාග්ධන සැපයුම් අවස්ථා ජංගම සේවාවන් ලෙස ගොවීන්ගේ ක්ෂේත්‍රවලට යනවා නම් මෙම ගැටළු විසඳේවි. ඒ සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මැදිහත්ව තරුණ ගොවි ව්‍යාපාරය ශක්තිමත් කළ යුතු යි.

**කෘෂි ක්ෂේත්‍රයේ, වාරිමාර්ග කළමනාකරණයේ පවතින ඇතැම් දුර්වලතා නිසා ගොවීන් අධෛර්යමත් වී සිටින බව අප ආයතනය විසින් මෑත දී සිදුකරන ලද විවිධ ගොවි සම්මන්ත්‍රණවල දී හෙළි වී තිබෙනවා. පාරම්පරික ගොවීන් තම දූවාදරුවන් ගොවිතැනින් ඈත් කිරීමට එය හේතුවක් කරගෙන සිටිනවා. මේ පිළිබඳ ඔබතුමාගේ අදහස කුමක්ද?**

විද්‍යාත්මක කෘෂිකර්මාන්තය වාරිමාර්ග වැඩසටහන හා ඒකාබද්ධ විය යුතු බව අපි පිළිගන්නවා. නමුත් අද වන විට විෂයයන් බෙදී ගිහින්, සබඳතා බෙදී ගිහින්. ඒ අවාසිය ගොවියන්ට යි. ජනපද ගොවීන් සක්‍රිය කිරීමට පහසුකම් අවශ්‍ය යි. නමුත් ලංකාවේ සෑමතැන ම තත්ත්වය මෙය නෙමෙයි. අපි සංඛ්‍යා ලේඛනාත්මකව පෙන්වා දෙනවා නම් ගැටළු ඇති ස්ථානවල දී හඳුනාගත් ප්‍රධාන ම හේතුවක් වුණේ ගොවීන්ගේ ඒකරාශී වීම, සමඟිය නැතිකම. රටට බත සපයන ගොවීන් නිලධාරීන්ට දෙවැනි විය යුතු නෑ. නිලධාරීන්ට දේශපාලකයන්ට බලපෑම් කළ යුතු යි. මන්දෝත්සාහී විය යුතු නෑ. තරුණයන් කෘෂි කර්මාන්තයට කැමතී. කෘෂි ව්‍යාපාරිකයන් වීමට කැමතී. උඩවලව, ඇඹිලිපිටිය, දඹුල්ල, පොළොන්නරුව, අනුරාධපුරයේ තරුණ ගොවීන් කුඩා ඉඩම්වල, විසිරි ජල ක්‍රම හෝ ළිං මගින් සූක්ෂ්ම වගාවේ නිරත වනු අපට දැනටමත් දැකගත හැකි යි. අස්වැන්න තමා ම තම වාහනවලින් වෙළෙඳපොළට ගොස් විකුණනවා.

**අපි වවමු - රට නගමු තෙවසරක වැඩපිළිවෙළ මුල් අදියර මෙම වසරෙන් අවසන්. ඔබ ආරම්භයේ දී අපේක්ෂා කළ දෑ මේ වන විට කොතෙක් දුරට සාධනය වී තිබේ ද?**

අපි සංඛ්‍යාත්මකව මේ ගැන සොයා බලා නෑ. එය සිදු කළ යුත්තේ ඔබ ආයතනය වැනි (හෙ.කො.ගො.ප.පු.ආ.) බාහිර ආයතනයක්. වී නිෂ්පාදනය වර්ධනය වෙලා. බඩ ඉරිඟු නිෂ්පාදනය වැඩි වී ආනයනය සීමා වෙලා. කහ, ඉඟුරු වර්ධනය පිළිබඳ සොයා බැලීමට අපි අපනයන සංවර්ධන දෙපාර්තමේන්තුවට බාර දී තිබෙනවා. මුං, කව්පි, උඳුවල ප්‍රගතියක් දක්නට ලැබෙනවා. තුන්වේලට ම බත් කෑම හා, සහල් ආශ්‍රිත ආහාර ප්‍රචලිත වීම නිසා තිරිඟු පිටි ආනයනය අඩුවෙලා. මේ අනුව අපට මිම්මක් තියෙනවා. අපේ වැඩපිළිවෙළ සාර්ථකයි කියලා. ඒ වගේ ම මහින්ද චින්තන ඉදිරි දැක්මෙන් පවසා තිබෙනවා "කෙතට අරුණැල්ල", ප්‍රතිපත්තිය "අපි වවමු - රට නගමු" වැඩ සටහන යටතේ ක්‍රියාවට නැංවීමෙන් කෘෂි අංශයෙන් අප ලබා ඇති ප්‍රගතිය යුද්ධය නිම කිරීම තරම් ම අගනා බව." ජනාධිපතිතුමාගේ එම ප්‍රකාශය අපට හොඳ මිම්මක්.

ධෛර්යයක්. මේ වන විට අපට අවස්ථාව ලැබිලා තියෙනවා. "අපි වවමු - රට නගමු" වැඩසටහන 2010 - 2013 ලෙස තවදුරටත් ක්‍රියාත්මක කිරීමට.

**ඕනම සාර්ථක වැඩපිළිවෙළක දුර්වලතා ද හමුවෙනවා. නව අදියර සඳහා පළමු අදියරේ දී හඳුනා ගත් දුර්වලතා මොනවා ද?**

කෘෂිකාර්මික පරිපාලන ආකෘතිය අනුව "අපි වවමු - රට නගමු" වැඩසටහන මෙහෙයවීම මධ්‍යම රජයෙන් වූ නමුත්, ක්‍රියාත්මක කළේ පළාත් සභාවලින්. මෙතැන දී තමයි ගැටළු මතුවුණේ. මධ්‍යම රජයෙන් පළාත් සභාවලට මුදල් මුදාහැරලා වාර්තා අනුමත කරලා දුන්නා පමණයි. අපි දිස්ත්‍රික්කවලට ගියා. ජන හමු තිබ්බා. ගෙවතු වගා තරග පැවැත්වුවා. එමගින් කෘෂිකර්ම ප්‍රබෝධයක් ඇති වුණා. නමුත් ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් මධ්‍යම හා පළාත් ආණ්ඩු අතර සමීපතාවය සිදු විය යුතු ය. වාර්තා වලින් පෙන්වා දෙන අන්දමට උතුර හා නැගෙනහිර තමයි මෙම සබඳතා හොඳින් ම වර්ධනය කරගෙන තිබුණේ. එය අනෙකුත් පළාත්වලට ද ආදර්ශයක්. දෙවැනි ප්‍රධානම දුර්වලතාවය විදිහට අප හඳුනාගන්තේ පෞද්ගලික අංශයට නිසි තැන හිමි නො වීම. ඔවුන් අපට අත්‍යවශ්‍ය යි. දැන් මූලික ම අරමුණ ජාතික නිෂ්පාදනය වැඩි කිරීම නිසා රජයේ සහනාධාර, ප්‍රතිපාදන හෝ ලබා දී පෞද්ගලික අංශය භෝග නිෂ්පාදනය, බෙදා හැරීම, අලෙවි කිරීම, අගය වැඩි කිරීම, ගබඩා කිරීම, අපනයනය සඳහා සම්බන්ධ කරගත යුතු යි. අනෙක් දුර්වලතාවය කාබනික පොහොර සම්බන්ධයෙන් මතු වුණා. රසායනික භාවිතය අවම කිරීම ජනාධිපතිතුමාගේ අරමුණක්. කාබනික පොහොර නිෂ්පාදනය ඇතුළු කර්තව්‍යයන් සඳහා පෞද්ගලික අංශය ද හවුල් කරගත යුතු යි.

**මේ දිනවල යල කන්නයේ වී අස්වැන්න අලෙවි කරගැනීම ගැටළුවක් වී ඇති බව පෙනෙනවා. මෙවැනි තත්ත්වයන්වල දී ඔබේ ව්‍යාපෘතියේ දායකත්වය කෙබඳු එකක් ද?**

අස්වැන්න එකවර වෙළෙඳපොළට පැමිණීමේ ගැටළුවයි සිදු වී තිබෙන්නේ. සාමාන්‍යයෙන් යල අස්වැන්න මහට සාපේක්ෂව අඩු වුනත් ජල පහසුකම් ලැබීම වැනි වාසිදායී කරුණු නිසා යල අස්වැන්න ද ඉහළ ගිහින්. එසේ නම් අස්වැන්න ගබඩා කර තබා ගැනීමේ පහසුකම් වී අලෙවි මණ්ඩලය සතු කළ යුතු යි. මානව හා භෞතික සම්පත් උත්පාදනය කළ යුතු යි. ගුණාත්මක සහල් නිපදවීම දිරිගන්වමින් සුපිරි මිලක් යටතේ සුපිරි වෙළෙඳසැල්වලට සැපයීම හා අපනයනය කළ යුතු යි. රජයේ බදු ප්‍රතිපත්තිය වැනි දේ මේ සඳහා බලපානවා. මෙහි දී වෙළෙඳ අමාත්‍යාංශය ද අප සමග ඒකරාශී විය යුතු යි.

**"අපි වවමු - රට නගමු" වැඩපිළිවෙළ සඳහා මාධ්‍යයන්ගෙන් ලැබුණු අනුග්‍රහය කෙබඳු ද?**

යම් යම් අවස්ථාවල උද්ගත වන සුළු සුළු අලෙවිකරණ ගැටළු වැඩිපුර ප්‍රචාරය කොට සමාජයේ භීතියක් ඇති කරන්නේ මාධ්‍යයන්. නමුත් අපේ වැඩසටහන හා වගාව සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල සැලකිය යුතු ඇල්මක් තිබුණා. විශේෂයෙන් ම විද්‍යුත් මාධ්‍ය ඔවුන්ගේ ජනප්‍රිය-ත්වය අලෙවි කරගැන්ම සඳහා අපේ වැඩසටහන යොදා ගත්තා. ඒ නිසා අපේ වැඩපිළිවෙළ ද ජනතාව අතර ජනප්‍රිය වුණා.

**මෙවැනි ජාතික සතියක් අභිමුව ඔබට සමාජයීය වශයෙන් දිය හැකි පණිවුඩයක් තිබේ ද?**

කෘෂිකර්මය ලාභදායී ව්‍යාපාරයක්. නමුත් එසේ වන්නේ එය වෘත්තියක් කරගත හොත් පමණයි. වගාව සැලසුම් කරන්න. බීජ, පොහොර, ජලය වැනි යෙදවුම් සඳහා ඔබට රාජ්‍ය අනුග්‍රහය ලැබෙනවා. කුඹුරෙන් උපරිම අස්වැන්න ලබාගන්න. ඒවා ලබාගෙන මධ්‍යම පන්තියෙන් ඉහළ සමාජ ස්ථරයකට ළඟාවීමට ගොවි මහත්වරුන්ට හැකි යි. වැඩිහිටි පරම්පරාවේ ගොවීන් සැබෑ තාර්කිකයන් විය යුතුයි. තරුණ ගොවීන් කෘෂිකර්මාන්තය හැදෑරිය යුතු යි. නවීන ගොවිතැන් ක්‍රම, තාක්ෂණය, ව්‍යාපාර කළමනාකරණය, උගත යුතු යි. ඒ සඳහා සුදුසු පාඨමාලා ලංකාවේ ඕනෑතරම් තිබෙනවා. ගොවියකු නොව ගොවි මහතකු වීමට සියළු දෙනා ඒකරාශී විය යුතු යි.

සංවාදය
වත්සලා ගමගේ
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිණී
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.